**බොරලැස්ගමුව නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින ලේකම් වෙත යවා ඇත.

**1.2. තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

**පහත සඳහන් ගිණුම්කරන අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.**

(අ) 2013 හා 2014 වර්ෂ වලට අදාලව 2016 වර්ෂයේදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු මුද්දර ආදායම පිළිවෙලින් රු.2,100,625 ක් හා රු. 25,608,073 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම සේ සලකා වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කිරීම නිසා වෙනත් ආදායම් රු.27,708,698 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ගබඩා ලෙජර ගිණුම්වල ඇතුලත් විදුලි භාණ්ඩ, වාහන අමතර කොටස් සහ ලේඛන හා පෝරම යන අයිතම් 16 ක වටිනාකම වූ රු.147,186 ක් අවසන් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) ගබඩා ලේජරයේ ඇතුලත් තොග අයිතම 21 ක වටිනාකම රු. 209,502ක් වැඩියෙන්ද තොග අයිතම 11 ක වටිනාකම රු. 116,246 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**
**--------------------------**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල ශේෂයන් සමඟ සැසඳීමේදි රු. 1,645,000 ක වෙනසක් පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගෙවීම් මූල්‍ය ප්‍රකාශන අනුව රු.5,464,148 ක් වූ නමුත් තැන්පත් ලේඛනය අනුව වර්ෂය තුල කරන ලද ගෙවීම් එකතුව රු.5,436,573 ක් වූ බැවින් රු.27,575 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**
**-------------------**

(අ) ආදායම් ණයගැතියන්ගෙන් අය විය යුතු රු.56,700 ක බලපත්‍ර ආදායම් ශේෂය 2011 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 10,737,028 ක් වූ හිඟ සේවක ණය ශේෂය තුල සේවකයන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.341,579 ක් දැනට අය නොවන අතර ඉන් සේවකයින් 06 දෙනකුගෙන් වර්ෂ 2 සිට වර්ෂ 7 ක කාලයක් තුල අය නොවී පවතින මුදල රු.200,034 ක් විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) 2015 වර්ෂය තුළදි තොග ලෙජර විධිමත්ව නඩත්තු කර නොතිබුණු අතර 2016 වර්ෂයේ ආරම්භක තොග ශේෂ පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සමඟ සසඳා නිවැරදි බවට තහවුරු කරගැනීමට අවශ්‍ය සාක්ෂි සභාව සතුව නොතිබුණි.

(ආ) ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දැක්වෙන විවිධ තැන්පතු වටිනාකම රු. 5,804,771ක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපලේඛන විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

**1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරික්ෂණය කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මු.රෙ. 110 | හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 104 (2) හා 1642 | 2016 වර්ෂයේ දී සිදුවී තිබූ වාහන අනතුරු 02ක් සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර පොලීසියටද වාර්තා කර නොතිබුණි. |
| (iii) මු.රෙ. 104 (3) (4) | 2016 වර්ෂයේ සිදුවූ අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා හා පූර්ණ වාර්තා සකස් කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 570 හා 571 | 2011,2012 සහ 2013 වර්ෂ වලට අදාල තැන්පත් වර්ග 05 ක වටිනාකම් රු.2,194,105 ක් රාජ්‍ය ආදායමට බැරකර නොතිබුණි. |
| (v) මු.රෙ. 751 සහ මහා නගර සභා හා නගර සභා ගිණුම් සංග්‍රහයේ ගබඩා බඩු සඳහා ගිණුම් පිළිබඳ උපදෙස් | සභාව සතු ගබඩා භාණ්ඩ සඳහා තොග පොත් පවත්වා නොතිබුණි. |
| (vi) **මු.රෙ.** 751 (4) | තොග ලෙජර අකාරාදි පිළිවෙලට නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (vii) | මු.රෙ. 1646 | සභාවට අයත් වාහන 10 ක ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (viii) | මු.රෙ. 1653 | **සභාවට අයත් වාහන 09 ක මයිලෝ මීටර් දිගු කලක සිට අක්‍රීයව පැවතුණි.** |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 3.5 වගන්තිය හා 3.17.2 වගන්තිය | ණයකරුවෙකුගේ සහ ඇපකරුවන්ගේ ණය සීමාව සියයට 40 ඉක්මවා ගොස් තිබූ නමුත් ණය ලබාදීමේදි එය සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | සභාව සතු වාහන 28ක් සම්බන්ධයෙන් ඉන්ධන දැවීම මාස 06කට වරක් පරික්ෂා කර නොතිබුණි. |
| (ඇ) | මහා නගර සභා, නගර සභා සඳහා වූ ගිණුම් සංග්‍රහය | රු.107,545,954 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 28,029,078 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.20,627,381 ක් විය.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 7,401,697කින් වැඩි වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 තථ්‍ය අයකරගත යුතු | 2016 තථ්‍ය අයකරගත් | 2016 වර්ෂයට හිඟය | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2015 තථ්‍ය අයකරගත යුතු | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 27,807 | 19,623 | 8,184 | 17,350 | 25,261 | 22,486 |
| බදු කුලී | 1,571 | 1,204 | 367 | 287 | 1,528 | 375 |
| බලපත්‍ර ගාස්තු | 401 | 338 | 63 | 63 | 336 | 57 |
| වෙනත් ආදායම් | 42,585 | 41,249 | 1,336 | 1,336 | 42,106 | 30,279 |

### 2.2.2 වරිපනම්

අ) වරිපනම් බදු අයකිරීම සඳහා වර්ෂ 5කට වරක් දේපල තක්සේරු කල යුතු වුවද බොරලැස්ගමුව නගර සභාව විසින් 2009 වර්ෂයට පසු දේපල තක්සේරු කර නොතිබුණි.

ආ) 2016 වර්ෂය සඳහා බිල් කරන ලද වාර්ෂික වරිපනම් බදු ආදායම රු.24,616,014 ක් වූ අතර ඉන් රු.16,431,554 ක් පමණක් වර්ෂය තුල අයකරගෙන තිබුණි. එය බිල් කරන ලද ආදායමින් සියයට 66.7 ක් පමණක් විය. මුළු ආදායමින් රු.8,184,460 ක් එනම් සියයට 33.3 ක් වර්ෂය තුලදී අයකරගෙන නොතිබුණි.

ඇ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.22,429,283 ක් වූ අතර ඉන් රු.16,138,163 ක් එනම් සියයට 72 ක් ප්‍රවර්තන වර්ෂය තුලදී අයකරගෙන තිබුණි.

ඈ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු. 17,349,832 ක් වූ අතර ඉන් රු.847,447 ක් රු.50,000 ට වැඩි වරිපනම් බදු ඒකක 11 කින් සමන්විත වී තිබුණි. මුළු හිඟ ශේෂයෙන් 2017 මාර්තු 17 දින වන විට රු. 12,840,462 ක් හිඟව පැවතුණි.

### 2.2.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳසැලේ කඩ කාමර වලින් රු. 166,706 ක් හා නව වෙළඳසැළේ කඩ කාමර වලින් රු. 122,436 ක් අයවිය යුතුව පැවතුනු අතර 2017 මාර්තු 31 දිනට මෙම හිඟය පිළිවෙලින් රු. 103,780 ක් හා රු. 46,424 ක් විය.

### 2.2.4 මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂය සඳහා රු.25,000,000 ක මුද්දර බදු ආදායමක් ඇස්තමේන්තුකර "වෙනත් ආදායම්" යන විෂයය යටතේ ආදායම් වියදම් ගිණුමට ගෙන තිබුණද, වර්ෂයට අදාලව මුද්දර බදු ආදායම් කිසිවක් අයකරගෙන නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) බොරලැස්ගමුව නගර සභාව විසින් කසළ බැහැර කිරීම සඳහා බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය සමඟ 2016 අගෝස්තු මස 01 දින නව ගිවිසුමකට එළඹ තිබුණු අතර 2016 ජනවාරි 01 සිට 2016 ජුලි 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා ගිවිසුමක් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. 2016 ජනවාරි සිට ජුලි දක්වා මිශ්‍ර අපද්‍රව්‍ය සඳහා විවිධ රේටයන් අනුව ගෙවීම් කර තිබුණි. මාර්තු සිට ජුලි දක්වා කාල පරිච්ඡේදය සඳහා ජනවාරි පෙබරවාරි මාසවල ගෙවීම්කල රේටයන් යොදාගනු වෙනුවට නව ගිවිසුමේ රේටයන් අනුව ගෙවීම් කර තිබුණි. ඒ අනුව මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු.3,450,855 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) බස්නාහිර පළාත් සංවර්ධන වැඩසටහන යටතේ ළදරු පාසලක් පැවත්වීම සඳහා සභාව විසින් රු.1,775,401ක් වැයකර වේරහැර කණිෂ්ඨ විද්‍යාලයේ ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කර තිබුණද එම ගොඩනැගිල්ලේ කොටසක් වේරහැර කණිෂ්ඨ විද්‍යාලය විසින් අත්පත්කරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹීමට සභාව කටයුතුකර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) 2009 වර්ෂයට පෙර සිට පැවත එන රු.188,905 ක් වන පෙර ගෙවුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම ශේෂය සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) සභාව සතු වාහන දෙකක් දිගු කාලයක් තුල ගර්හිත තත්වයේ පැවති අතර එම වාහන ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ හේතූන් මත අයනොවී තිබුණු රු.219,327 ක සේවක ණය ඇපකරුවන්ගෙන් හෝ වෙනත් යෝග්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කර ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂය තුලදී රු. 55,765,767 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණු අතර ඉන් රු.360,483 ක මුදලක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) 2016 ජනවාරි 01 දිනට ලැබිය යුතු ගිණුම් යටතේ දැක්වූ මන්ත්‍රී දීමනා හා ලැබිය යුතු වැටුප් පිළිවෙලින් රු.298,500 සහ රු.5,966,866 ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමෙන් තොරව කපාහැර තිබුණි.

(ඊ) ආයතන 08 ක් විසින් සභාබල ප්‍රදේශයේ සවිකර තිබූ දැන්වීම් පුවරු 08ක් සඳහා 2016 ජුලි දක්වා අයවිය යුතු ගාස්තු රු.87,000 ක් අයකරගෙන නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ සභා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති යටතේ ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති 82 ක් අතරින් ව්‍යාපෘති 02 ක් අවලංගුකර තිබූ අතර නිම නොකළ ව්‍යාපෘති ගණන 08 ක් විය.

### 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සෞඛ්‍ය කම්කරුවන් 09 දෙනෙකු රියදුරන් ලෙස සේවයේ යොදවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 4.08 සිට සියයට 100 දක්වා විචලනයන් පැවති අවස්ථා 17 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සභාව විසින් ඇස්තමේන්තුගත කරන ලද වියදම් විෂයයන් 25 ක එකතු වටිනාකම වූ රු.19,135,000 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ අය වැය ලේඛණය අනුව භෞතික සැලසුම් වැඩ සටහන යටතේ ඉඩම් හා ගොඩනැගිලි ව්‍යාපෘතිය සඳහා වෙන් කල ප්‍රතිපාදන වලින් කම්ටු දීමනා වැය විෂය හැර අනෙකුත් වැය විෂයයන් වල ප්‍රතිපාදන එකතු වටිනාකම රු.3,194,900 ක් සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ අයවැය ලේඛනය අනුව වැය විෂයයන් 14කට වෙන්කල ප්‍රතිපාදන සියයට 16 සිට සියයට 96 දක්වා ඌන උපයෝජනය කර තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.133 (1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි.

(ආ) මු.රෙ. 134(1),(2) හා (3) හි දැක්වෙන පරිදි,

i. ආයතනයේ මුදල් හා පරිපාලන කටයුතු වලින් නිදහස් වු ඒකකයක් ලෙස ක්‍රියා කිරීම,

ii. අභ්‍යන්තර විගණන වැඩසටහන් විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව සකස් කිරීම,

iii. අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම

යනාදී කරුණු සම්බන්ධයෙන් යොමුගත විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරනු ලැබේ.**

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) අයවැය පාලනය